## දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

### තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමානය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 03 | PL-01-2016 | රා.ප.ච. 3/2016 අනුව<br><br>රු. 24250-250x10-270x10-300x10-330x12-රු. 36410<br><br>III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 8 වන ශ්‍රේණිය 9 වසර සමත්ව තිබිය යුතු ය.<br><br>**කායික සුදුසුකම්**<br>තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. |
| 02 | මුරකරු | 01 | PL-01-2016 | රා.ප.ච. 3/2016 අනුව<br>රු. 24,250-250x10-270x10-300x10- 330x12-රු. 36410<br><br>III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | **අධ්‍යාපන සුදුසුකම්**<br>අ.පො.ස.(සා.පෙ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙන් සම්මාන 02 ක් සහිතව විෂයන් හය (06) ක් සමත් විය යුතුය. (මින් විෂයන් පහක් (05) එකවර සමත් විය යුතු ය.)<br><br>**කායික සුදුසුකම්**<br>තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. |

01. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

I අයදුම්පත්‍ර බාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ හෝ පළාත් පාලන රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ).

II අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකුව විය යුතුය.

III අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

IV යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

V තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය* .- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් සිදු කරනු ලැබේ. විෂය නිර්දේශය හා ලබා දෙන ලකුණු පහත පරිදි වේ.

*මුරකරු :*

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම | 20 | 50 |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

*වැඩ ක්ෂේත්‍ර කම්කරු :*

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50 |
| තනතුරට අදළව ලබා ඇති පලපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(I) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(II) වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ද දායක විය යුතුය.

(III) පත්වීම වසර 03ක පරිවාස කාලයකට යටත් වන්නේය.

(IV) මෙම බඳවා ගැනීම් ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද, රජය හෝ බස්නාහිර පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලටද අනුකූලය. ඒ අනුව ක්‍රියා කිරීමට සියළුම සේවකයින් බැඳී සිටිය යුතු වේ.

04. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් සහතික වල ඡායා පිටපත් සමග 2018.08.28 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්" දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව, දොඩන්ගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- උප්පැන්න සහතිකය
- ජාතික හැඳුනුම්පත
- අධ්‍යාපන සහතික, ඉහළම අධ්‍යාපන සුදුසුකම් දක්වෙන වෙනත් සහතික
- තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය
- මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික 02 ක්
  (එක් චරිත සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහතාගෙන් ලබා ගත යුතුය. එය ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ යුතුය)
- වෘත්තීය පලපුරුද්ද හා වෙනත් සුදුසුකම් දක්වෙන සහතික
- දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තැපෑලේ දී නැති වන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවූ අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලැබෙන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

පී. ජී. පී. රුද්‍රිගෝ,
ලේකම්,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දොඩන්ගොඩ.

2018 ජූලි මස 18 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දොඩන්ගොඩ.

**ආදර්ශ අයදුම් පත්‍රය**

බස්නාහිර පළාතේ රාජ්‍ය සේවයේ දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ

........................................................ *තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :...........................................................................
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් ඃ ...........................................................................
03. ස්ථිර ලිපිනය :.........................................................................
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..........................................................................
05. ජාතික හැඳුනුම්පත් අංකය :........................................................................
06. දුරකථන අංකය :.........................................................................
07. උපන් දිනයඃ වර්ෂය :........................... මාසය :..................... දිනය :...................
08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ .................................................................
    අවුරුදුඃ............... මාස :............. දිනඃ ........
09. විවාහක / අවිවාහක බව :....................................................

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? යන වග : ..............................................

අධ්‍යාපන සුදුසුකම් : ..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

වෙනත් සුදුසුකම් :..........................................................................................................................

11. මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මීට පෙර මා රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබුවකු හෝ සේවය අතහැර ගිය අයකු හෝ සාපරාදී වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් මගින් වරදකරුවකු වී නොමැති අයකු බවත් මා ඉහත තනතුර සඳහා තෝරා පත්කර ගැනීමට පෙර හෝ පසුව ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට හෝ දඬුවම් ලැබීමට යටත් බවත් දනිමි.

...........................................;

දිනය :.................................. අයදුම්කරුගේ අත්සන.

12. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවකු නම්) දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියා ලවා මෙම කොටස සම්පූර්ණ කරවා ගන්න.

ඉහත අයදුම්කරුවන ................................................................. මහතා / මිය / මෙනෙවිය මෙම ආයතනයේ ........................................ ................. වශයෙන් ................................................ දින සිට කටයුතු කරනු ලබයි. ඇයගේ / ඔහුගේ පත්වීම ............................... දින සිට ස්ථිර කර ඇත. අයදුම්කරු මීට පෙර විනයානුකූලව දඬුවම් ලබා ඇති / නැති අතර ඇයට / ඔහුට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමක් මේ වන විට සිදු කරමින් / නොකරමින් නොපවතී. මෙම තනතුරට තෝරා පත් කරනු ලැබුවහොත් ඔහු / ඇය සේවයෙන් මුදා හැරිය හැකිය / නොහැකිය. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

. ...........................................;

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ /
ආයතනික ප්‍රධානියාගේ
අත්සන.

දිනය :.................................. .

13. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවකු නම්) මෙම කොටස සම්පූර්ණ කරන්න.

1. දැනට දරන තනතුර :..........................................................................................................

I. එම තනතුරට පත් වූ දිනය :..........................................................................................................
වර්තමාන සේවා ස්ථානය හා ලිපිනය